රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 28/95

මගේ අංකය: 1-543ඊ 2ඩී/12/95/1
ආයතන අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.09.29

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුවේ ඒජන්තවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන් හා
රාජ්‍ය සංස්ථාවල රජයට අයත් ව්‍යාපාරික ආයතනවල සභාපති/
නිසි බලධාරීන් වෙත.

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා 17/92 අනුව**
**<u>සහන ලකුණු අපේක්ෂකයන් බඳවා ගැනීම</u>**

විවෘත තරඟ විභාගවලින් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීම සඳහා 1990.03.09 දින නිකුත් කරන ලද අංක15/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 1992.03.24 දිනැති අංක 17/92 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද සහන ලකුණු අපේක්ෂකයන් බඳවා ගැනීමේ ක්‍රමය පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

02. ත්‍රස්තවාදීන්ගේ බලපෑම් වලට ලක්වූ පවුල්වල ජීවිත හා දේපල හානි සඳහා සලකනු ලබන අනුග්‍රහය මින් පසු පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින් ගෙවන වන්දි මුදල් හා වෙනත් සහන සඳහා පමණක් සීමා කරනු ලබන අතර එබඳු පවුල් සඳහා අංක 17/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සහන ලකුණු ලබාදීම මින් පසු සිදු නොකෙරේ.

03. රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී ජනවාර්ගික/ජනගහන අනුපාතය අනාගතයේදී සලකා බලනු ලබන්නේ විවෘත තරඟ විභාග මගින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී පමණකි.

04. මෙහි විධිවිධාන 1995.06.23 දින සිට බලපැවැත්වේ.

05. 1992.03.24 දිනැති අංක 17/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

**අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)**
වැඩ බලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය